මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2025 මාර්තු 26 |

*මුදල් ප්‍රතිපත්ති විවරණය: අංක 02 - 2025 මාර්තු*

# ශ්‍රී ලංකා මහ බැංකුව එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය නොවෙනස්ව පවත්වා ගනී

මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය ඊයේ දින පැවති සිය රැස්වීමේ දී එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සියයට 8.00ක් ලෙස නොවෙනස්ව පවත්වා ගෙන යෑමට තීරණය කළේය. දේශීය සහ ගෝලීය ආර්ථික ප්‍රවණතා පිළිබඳව මනාව සලකා බැලීමෙන් අනතුරුව මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය මෙම තීරණයට එළැඹිණි. දැනට පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය උද්ධමනය සියයට 5ක ඉලක්කය කරා ළඟාවීම සහතික කරමින් දේශීය ආර්ථිකයේ වර්ධනය සඳහා සහාය වනු ඇති බව මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විශ්වාස කරයි.

ප්‍රධාන වශයෙන් විදුලි ගාස්තු සහ ඉන්ධන මිල ගණන් අවස්ථා කිහිපයක දී අඩු කිරීම හේතුවෙන් උද්ධමනය දැනට ඍණ මට්ටමක පවතී. 2025 මාර්තු මාසයේ සිට මෙම අවධමනකාරී තත්ත්වය ක්‍රමයෙන් ලිහිල් වනු ඇතැයි අපේක්ෂා කරන අතර, 2025 මැද භාගය වන විට උද්ධමනය ධන අගයක් වනු ඇතැයි පුරෝකථනය කෙරේ. දැනට පවතින දත්ත මත පදනම් වූ පුරෝකථන අනුව, 2025 වසර අවසානය වන විට උද්ධමනය ඉලක්කගත මට්ටම් කරා ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වසර දෙකක් තුළදී සංකෝචනයන් වාර්තා කිරීමෙන් අනතුරුව දේශීය ආර්ථිකය 2024 වසරේ දී ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත් වී ඇතැයි නවතම වාර්ෂික ඇස්තමේන්තු මගින් පෙන්නුම් කරයි. ආර්ථිකයේ මෑත කාලීන ප්‍රවණතා සහ ප්‍රධාන ආර්ථික දර්ශක මගින් මෙම වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පවතිනු ඇතැයි පෙන්නුම් කෙරේ.

රුපියල් ද්‍රවශීලතාව අතිරික්ත මට්ටමක පවතී. ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව වෙළඳපොළ පොලී අනුපාතික අඛණ්ඩව අඩු විය. අඩු පොලී අනුපාතිකවල සහාය ඇතිව පෞද්ගලික අංශය වෙත ලබා දෙන ණය ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කරයි. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහාය ලබාදෙමින් මෙම ප්‍රවණතාව අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය අපේක්ෂා කළ මට්ටමට වඩා හිතකරව පවතී. අපනයන අඛණ්ඩව ඉහළ ගිය අතර, ආනයන වර්ධනය වීම හේතුවෙන් වෙළඳ හිඟය පුළුල් විය. සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් විදේශීය ජංගම ගිණුම වර්ධනය වීමට උපකාරී විය. ආයෝජක විශ්වාසය ඉහළ යෑම පිළිබිඹු කරමින් රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙත විදේශ විනිමය ගලා ඒම මෑත කාලීනව ඉහළ

ගියේය. මහ බැංකුව විදේශ විනිමය ශුද්ධ පදනම මත මිලදී ගැනීම ඉහළ යෑම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙහි සිව්වන වාරිකය ලැබීම දළ නිල සංචිත ප්‍රමාණය ඉහළ නැංවීමට උපකාරී වූ අතර එමගින් විදේශීය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු වී ඇත. 2025 වසරේ මේ දක්වා කාලය තුළදී ශ්‍රී ලංකා රුපියල සුළු වශයෙන් අවප්‍රමාණය වී ඇත.

උද්ධමනය සහ ආර්ථික වර්ධන ඉදිරි දැක්ම කෙරෙහි බලපාන අවදානම් බොහෝ දුරට තුලිතව පවතී. කෙසේ වෙතත්, ගෝලීය වෙළඳ ක්‍රියාකාරකම් සහ භූ දේශපාලනික අවිනිශ්චිතතා ඇතුළු ගෝලීය ආර්ථික ප්‍රවණතා මගින් ශ්‍රී ලංකා ආර්ථිකයට ඇති විය හැකි බලපෑම  පිළිබඳව මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය අවධානයෙන් සිටියි. ඒ අනුව, මුදල් ප්‍රතිපත්ති සම්පාදනය අඛණ්ඩව ඉදිරි දැක්මකින් සහ දත්ත මත පදනම් වනු ඇත. ආර්ථිකය එහි උපරිම ධාරිතා මට්ටමට ළඟා වීම සඳහා සහාය වන අතරම, මිල ස්ථායිතාව පවත්වා ගැනීම කෙරෙහි ඇතිවන අවදානම් සඳහා ක්‍රියාමාර්ග ගැනීමට මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සූදානම්ව සිටියි.

මීළඟ මුදල් ප්‍රතිපත්ති නිවේදනය 2025 මැයි 28 වැනි දින නිකුත් කිරීමට නියමිතය.

---

[i] උද්ධමන ව්‍යාප්ති සටහන සඳහා ප්‍රවේශය https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/mpr_fan_chart_02_2025_s.pdf

[ii] දත්ත ඇමුණුම වෙත ප්‍රවේශය https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/mpr02_2025_s.pdf